# 11 විභක්ති

සම්පූර්ණ අර්ථයක් ප්‍රකාශ වන වගන්තියකට වාක්‍යයක් යැයි කියමු. වාක්‍යයක් අර්ථ සහිත වීමට නම් අවම වශයෙන් ක්‍රියා පදයක් හා ඊට සම්බන්ධ නාම පදයක් තිබිය යුතු ය. යම් නාම පදයක් අර්ථවත් වන්නේ එය කේවලව (තනිව) පවතිද්දී නො ව වාක්‍යයක යෙදෙන විට යි. එසේ යෙදීමේ දී අර්ථය සේ ම පද රටා ද වෙනස් වෙයි. නාම ප්‍රකෘතියකින් පරව අර්ථ බෙදා දැක්වීම සඳහා සංයෝග වන්නේ විභක්ති යි.  නාම ප්‍රකෘතියකට විභක්ති ප්‍රත්‍යය එකතු කළ විට පදය විවිධ අර්ථවල යෙදෙයි.

| නාම ප්‍රකෘතිය | + | විභක්ති ප්‍රත්‍යය | = | විභක්ති පදය |
|---|---|---|---|---|
| ↓ | | ↓ | | ↓ |
| ගොවි | | ආ | = | ගොවියා |

| ඒක වචන | බහු වචන |
|---|---|
| ගොවි + ආ - ගොවියා | ගොවි + ඕ - ගොවියෝ |
| ගොවි + ආට - ගොවියාට | ගොවි + අන්ට - ගොවියන්ට |
| ගොවි + ආගෙන් - ගොවියාගෙන් | ගොවි + අන්ගෙන් - ගොවියන්ගෙන් |
| ගොවි + ආගේ - ගොවියාගේ | ගොවි + අන්ගේ - ගොවියන්ගේ |

ප්‍රථමා, කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර, ආලපන යනුවෙන් එවැනි බෙදීම්, එනම් 'විභක්ති' නවයක් සිංහල භාෂාවෙහි දක්නට ලැබේ. කිසියම් නාම ප්‍රකෘතියක් මෙම විභක්ති නවයෙහි ඒක වචන හා බහු වචන වශයෙන් බෙදා දැක්වීම 'වරනැඟීම' යනුවෙන් හැඳින්වේ. පුරුෂ, ස්ත්‍රී, නපුංසක යන ලිංග තුනට ම අයත් නාම පද මෙසේ වරනැඟිය හැකි ය.

## 1. ප්‍රථමා විභක්තිය

(අ) පියවරු දරුවන් රකිති.

මේ වාක්‍යයේ **රකිති** යන ක්‍රියාව කරන්නේ **පියවරු** ය. රකින්නේ කවරෙක් ද යන ප්‍රශ්නය නැඟූ විට පිළිතුර වන්නේ **පියවරු** යන්න යි. එනම් රකිති යන ක්‍රියාවෙන් උක්ත වී ඇත්තේ **පියවරු** යන පදය යි. එය **උක්ත කර්තෘ** ය. උක්ත කර්තෘ නිතර ම යෙදෙන්නේ ප්‍රථමා විභක්තියෙනි.

i. **ලේඛකයා** පොතක් ලියයි.
ii. **ගොවියෝ** ගවයන් රකිති.
iii. **ශිෂ්‍යයා** ක්‍රීඩා කරයි.
iv. **මල්ලී** පරිගණකය ක්‍රියා කරවයි.

මේ වාක්‍යවල ලියයි, රකිති, ක්‍රීඩා කරයි, ක්‍රියා කරවයි යන ක්‍රියා පදවලින් උක්ත වන්නේ ලේඛකයා, ගොවියෝ, ශිෂ්‍යයා, මල්ලී යන කර්තෘ පද යි. ඒවා යෙදී ඇත්තේ ප්‍රථමා විභක්තියෙනි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**වාක්‍යයක කර්ම පදය උක්ත වූ අවස්ථා ද පවතී.**

(ආ) පියවරුන් විසින් දරුවෝ රැකෙති.

මේ වාක්‍යය 'පියවරු දරුවන් රකිති' යන්නට වඩා වෙනස් ය. එහෙත් අදහසින් එක සමාන ය. **රැකෙති** යන ක්‍රියා පදයෙන් උක්ත වන්නේ **දරුවෝ** යන කර්ම පදය යි. එම **උක්ත කර්ම පදය** යෙදෙන්නේ ද ප්‍රථමා විභක්තියෙනි.

i. ගොවියන් විසින් **කුඹුරු** වැපිරෙයි/වපුරනු ලබයි.
ii. වෛද්‍යවරුන් විසින් **රෝගීහු** සුවපත් කෙරෙති/කරනු ලබති.
iii. සෙබළුන් විසින් **ත්‍රස්තවාදීහු** පැරදවෙති/පරදවනු ලබති.
iv. සත්ත්වවේදීන් විසින් **සත්තු** පරීක්ෂා කෙරෙති/කරනු ලබති.

මෙහි වැපිරෙයි, කෙරෙති, පැරදවෙති, පරීක්ෂා කෙරෙති යන ආඛ්‍යාතවලින් උක්ත වන්නේ කුඹුරු, රෝගීහු, ත්‍රස්තවාදීහු, සත්තු යන කර්ම පදයි. ඒවා ප්‍රථමා විභක්ති ගනී.

- කර්තෘ කාරක වාක්‍යයක එනම්, කර්තෘ උක්ත වන වාක්‍යයක 'උක්ත කර්තෘ' ප්‍රථමා විභක්තියෙන් යෙදේ.
- කර්මකාරක වාක්‍යයක එනම්, කර්මය උක්ත වන වාක්‍යයක 'උක්ත කර්මය' ප්‍රථමා විභක්තියෙන් යෙදේ.

**1.1 පහත දැක්වෙන වාක්‍යවල ඇති ප්‍රථමා විභක්ති පදයට යටින් ඉරක් අඳින්න.**

i. වෑත්තෑවේ හිමි ගුත්තිල කාව්‍යය රචනා කළේ ය.
ii. කලාකරුවෝ සම්මන්ත්‍රණයට සහභාගි වූහ.
iii. බාලිකාවෝ උදෑසන ම පාසලට පැමිණෙති.
iv. ඉතිහාසඥයෝ ශාස්ත්‍රීය සාකච්ඡා පවත්වති.
v. කතුවරුන් විසින් ශිෂ්‍යයෝ ක්‍රීඩාවට යොමු කෙරෙති/යොමු කරනු ලබති.
vi. දක්ෂ නිළියන් විසින් රසිකයෝ සතුටු කෙරෙති/කරනු ලබති.
vii. මව විසින් දරුවෝ ඇගයෙති/අගයනු ලබති.

**1.2 ප්‍රථමා විභක්ති පද පහක් යොදා වාක්‍ය පහක් නිර්මාණය කරන්න.**

## 2. කර්ම විභක්තිය

පියවරු **දරුවන්** රකිති.

මේ වාක්‍යයේ **රකිති** යන ක්‍රියාවට යටත් වන්නේ **දරුවන්** ය. එනිසා **දරුවන්** යන පදය වාක්‍යයේ කර්මය ලෙස සැලකේ. කර්මය අනුක්තව යෙදෙන බැවින් **අනුක්ත කර්මය** යනුවෙන් ද හැඳින්වෙයි. අනුක්ත කර්මය නිතර ම යෙදෙන්නේ කර්ම විභක්තියෙනි.

i. දෙමාපියෝ **දරුවන්** යහමඟ යවති.
ii. පොලිස් නිලධාරීහු **නිවැරදිකරුවන්** ආරක්ෂා කරති.
iii. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා **ගුරුවරුන්** දැනුවත් කරයි.
iv. කම්කරුවෝ **ඉල්ලීම්** දිනා ගනිති.

මේවායේ යවති, ආරක්ෂා කරති, දැනුවත් කරයි, දිනා ගනිති යන ක්‍රියාවලට යටත් ව ඇත්තේ දරුවන්, නිවැරදිකරුවන්, ගුරුවරුන්, ඉල්ලීම් යන කර්ම විභක්ති පදයි.

- මෙන්, සේ, වැනි, එව්, ලෙස, මුත්, විලස, පාසා, වෙත, කරා යනාදි නිපාත පද සමග යෙදෙන්නේ ද කර්ම විභක්ති පදයි.

i. ඇය දෙවඟනක **මෙන්** රූමත් ය.
ii. දුදනන් **ලෙස** නො හැසිරෙමු.
iii. මම ඔවුන් **වෙත** නො යමි.
iv. දරුවන් **විනා** මා පියන්ට කවර සම්පතක් ද?
v. යාචකයා මිනිසුන් **කරා** පැමිණ සිඟමන් ඉල්ලී ය.

2.1. **පහත දැක්වෙන වාක්‍යවල ඇති කර්ම විභක්ති පද උපුටා ලියන්න.**

i. සභාපතිතුමා සාමාජිකයන් අමතයි.
ii. තරුණ තරුණියෝ වැඩිහිටියන් නමදිති.
iii. දෙමවුපියෝ ක්‍රීඩා උත්සවය නරඹති.
iv. පාලකයා සේවකයන් කැඳවී ය.

**2.2 පහත දැක්වෙන කර්ම විභක්ති පද යොදා වාක්‍යය බැගින් සාදන්න.**

මිතුරන්, ඉතිහාසඥයන්, ක්‍රීඩකයන්, නායකයන්, ලේඛකයන්


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 3. කර්තෘ විභක්තිය

**පියවරුන් විසින් දරුවෝ රැකෙති.**

මේ වාක්‍යයේ **රැකෙති** යන ක්‍රියා පදයෙන් ඉස්මතු වන්නේ/උක්ත වන්නේ **දරුවෝ** යන්නයි. පියවරුන් විසින් යන්න ඉස්මතු නො වේ/උක්ත නො වේ. එබැවින් එය **අනුක්ත කර්තෘ** ය. වාක්‍යයක **අනුක්ත කර්තෘ** කර්තෘ විභක්තියෙන් යෙදෙයි.

i. **ආදි ශිෂ්‍යයන්** විසින් ගුරුවරු නැමදෙති/නමදිනු ලබති.
ii. **පාරිභෝගිකයන්** විසින් භාණ්ඩ මිල දී ගැනෙයි/ගනු ලබයි.
iii. **පරාර්ථකාමීන්** විසින් අසරණයෝ පෝෂණය කෙරෙති/කරනු ලබති.
iv. **කුරුල්ලන්** විසින් තම පැටවු පරිසරයට හුරු කෙරෙති/කරනු ලබති.

මේවායේ නැමදෙති/නමදිනු ලබති, ගැනෙයි/ගනු ලබයි, පෝෂණය කෙරෙති/කරනු ලබති, හුරු කෙරෙති/කරනු ලබති, යන ක්‍රියා පදවලින් උක්ත වී ඇත්තේ ගුරුවරු, භාණ්ඩ, අසරණයෝ, පැටවු යන පද යි. ආදි ශිෂ්‍යයන් විසින් පාරිභෝගිකයන් විසින්, පරාර්ථකාමීන් විසින් කුරුල්ලන් විසින් යන පද යෙදී ඇත්තේ අනුක්තව නිසා ඒවා කර්තෘ විභක්තිය ගනී.

**3.1 වරහන් තුළ දී ඇති පද සුදුසු පරිදි සකස් කර හිස්තැනට යොදන්න.**

i. ..................................... බසය පදවනු ලබයි. (රියැදුරු)
ii. ..................................... සුරතල් සත්තු ඇති කෙරෙති. (සොයුරිය)
iii. ..................................... ගෙහිමියෝ විමසනු ලබති. (ආගන්තුකයා)
iv. ..................................... සේවකයෝ කැඳවනු ලබති. (ප්‍රධානයා)
v. ..................................... ශිෂ්‍යයෝ යහමග යැවෙති. (ගුරුවරයා)

**3.2 පහත දැක්වෙන කර්තෘ විභක්ති පද යොදා වාක්‍ය සකසන්න.**

සාමාජිකයන් විසින්, ළදැරිය විසින්, නිෂ්පාදකවරයා විසින්, නිලධාරීන් විසින්, වෙළෙන්දා විසින්

## 4. කරණ විභක්තිය

පියවරු **සෙනෙහසින්** දරුවන් රකිති.

මෙම වාක්‍යයේ **රකිති** යන ක්‍රියාවට උපකාරී වී ඇත්තේ **සෙනෙහස** යි. කර්තෘගේ ක්‍රියාවට උපකාරී වන පදය යොදන්නේ කරණ විභක්තියෙනි. එනිසා **සෙනෙහසින්** යන පදය කරණ විභක්ති ගනී. එයින් 'හේතු කොට ගෙන', 'කරණ කොට ගෙන' යන අර්ථ ප්‍රකාශ වේ.

i. අපි **පොතපතින්** උගනිමු.
ii. අපේක්ෂකයා **මයික්‍රෆෝනයෙන්** ජනයා අමතයි.
iii. පැසුණු **හිසින්** බුහුමන් ලබව.
iv. ලොව **මල්වලින්** අලංකාර වෙයි.

මේවායේ කර්තෘගේ ක්‍රියාවට උපකාර වී ඇත්තේ පොතපතින්, වේගයෙන්, හිසින්, මල්වලින් යන පද යි. ඒවා කරණ විභක්තියෙන් යෙදෙයි.

4.1 **පහත සඳහන් වාක්‍යවල කරණ විභක්ති අර්ථ දෙන පදවලට යටින් ඉරක් අඳින්න.**

i. අපි සුවඳ මලින් බුදුන් පුදමු.
ii. නිමල් දුම්රියෙන් ගමට ගියේ ය.
iii. ශිෂ්‍යයෝ ඉගෙනුමෙන් ජය ගත්හ.
iv. ඔහු සැප සම්පත්වලින් පොහොසත් ය.
v. මල්ලී පෑනෙන් අකුරු ලියයි.

4.2 **පහත සඳහන් වචන යොදා කරණ විභක්ති අර්ථ දෙන වාක්‍ය සාදන්න.**
රථයෙන්, රූපයෙන්, ධනයෙන්, ආයුධවලින්, ආභරණවලින්

## 5. සම්ප්‍රදාන විභක්තිය

පියවරු දරුවන්ට රැකවරණය දෙති.

මේ වාක්‍යයේ රැකවරණය ලබන්නේ **දරුවන්** ය. යමක් ලබන්නා එනම් ප්‍රතිග්‍රාහකයා හඟවන පදය **දරුවන්ට** යනුවෙන් සම්ප්‍රදාන විභක්තියෙන් යෙදෙයි.

i. බැතිමත්හු **දෙවියන්ට** පඬුරු පුදති.
ii. පාලකයෝ **උගතුන්ට** පහසුකම් සලසති.
iii. දෙමාපියෝ **දරුවනට** අවවාද දෙති.
iv. පොලිස්පතිතුමා උසස් **නිලධාරීන්ට** උපදෙස් දෙයි.

ඉහත වාක්‍යවල පඬුරු ලබන, පහසුකම් ලබන, අවවාද ලබන, උපදෙස් ලබන, අය හඳුන්වන්නේ දෙවියන්ට, උගතුන්ට, දරුවන්ට, උසස් නිලධාරීන්ට යනුවෙනි. එ බැවින් ඒවා සම්ප්‍රදාන විභක්තියෙන් යෙදේ.

- **වස්, පිණිස, උදෙසා, සඳහා** යන නිපාත සම්ප්‍රදාන විභක්ති පද සමග යෙදේ.

i. සෙබළු රට රකිනු වස් පෙරමුණට ගියහ.
ii. භික්ෂූහු දන් පිණිස පිඬු සිඟා වැඩියහ.

5.1 **පහත දැක්වෙන නාම පදවල සම්ප්‍රදාන විභක්ති රූප ලියා දක්වන්න.**

වනිතාව, සංචාරකයා, විද්‍යාඥයෝ, සේනාව, මුරකරු

5.2 **එම සම්ප්‍රදාන විභක්ති වචන යොදා වාක්‍ය සකස් කරන්න.**

## 6. අවධි විභක්තිය

පියවරු **පාසලෙන්** දරුවන් රැගෙන යති.

මෙහි රැගෙන යාමේ සීමාව දක්වන්නේ **පාසලෙන්** යන පදයෙනි. **එසේ සීමාවක්, වෙන් වීමක්, පහ වීමක්** හඟවන පද යෙදෙන්නේ අවධි විභක්තියෙනි.

i. විදේශිකයෝ **රටින්** නික්ම යති.
ii. වෙළෙන්දෝ **පදික වේදිකාවෙන්** ඉවත්ව යති.
iii. ගොවියෝ වගා **ළිඳෙන්** ජලය ගත්හ.
iv. කම්කරුවා **වහලයෙන්** බිමට බසී.

මේ වාක්‍යවල නික්ම යාමට, ඉවත්ව යාමට, ජලය ගැනීමට, බිමට බැසීමට සීමාව දැක්වුණේ රටින්, පදික වේදිකාවෙන්, ළිඳෙන්, වහලයෙන් යන පදවලිනි. මේ පද අවධි විභක්තියෙන් යෙදෙයි.

6.1 **පහත දැක්වෙන පදවලට අනුරූප අවධි විභක්ති පද ලියන්න.**
නගරය, පාසල, ගංගාව, පොත, ගස

6.2 **එම අවධි විභක්ති පද යොදා වාක්‍ය සාදන්න.**

## 7. සම්බන්ධ විභක්තිය

පියවරු **දරුවන්ගේ** දස්කම් අගයති.

මේ වාක්‍යයේ එන **දස්කම්** යන්න අයත් වන්නේ දරුවන්ට ය. යම් දෙයක, යම් කෙනෙකුගේ **අයිතිය, ස්වාමිත්වය, හිමිකම** හෝ **සම්බන්ධය** දැක්වීමේ දී යොදා ගන්නේ සම්බන්ධ විභක්ති පද යි. එනිසා **දරුවන්ගේ** යන පදය සම්බන්ධ විභක්තියට අයත් වේ.

i. මේ **අපේ** පාසල යි.
ii. මේ සුරතල් **නංගීගේ** මාලය යි.
iii. **දරුවන්ගේ** අදහස් වැදගත් ය.
iv. ඒ ඉතා මිහිරි කවිය **ගැල්කරුවාගේ** ය.

මේ වාක්‍යවල අපේ, නංගීගේ, දරුවන්ගේ, ගැල්කරුවාගේ යන පදවලින් ස්වාමිත්වයක් අයිතියක් ගැන කියවෙන බැවින් සම්බන්ධ විභක්තියෙන් යෙදෙයි.

7.1 **පහත දැක්වෙන වාක්‍යවල සම්බන්ධ විභක්ති පද නම් කරන්න.**

i. පුටුවෙහි කකුල් අබලන් ය.
ii. ලේඛකයන්ගේ පොත් අගය කරමු.
iii. අපගේ දස්කම් බලා සතුටු වන්න.
iv. ගස්වල අතු කඩා වැටෙයි.
v. ඇතින් ඇසෙන්නේ මොනරුන්ගේ හඬ යි.

7.2 **නාම පද පහක් තෝරා ගෙන ඒවා සම්බන්ධ විභක්ති අර්ථයෙහි යොදා වාක්‍ය නිර්මාණය කරන්න.**

## 8. ආධාර විභක්තිය

පියවරු **නිවෙස්හි** වෙසෙන දෙවිවරු ය.
පියවරු **දරුවන් කෙරෙහි** දයාව පාති.

මේ වාක්‍යයේ පියවරුන්ට වාසය කිරීමට ආධාර වී ඇත්තේ **නිවාස** යි. යම් දෙයක් **පැවැත්මට** හෝ **දරා ගැනීමට** ආධාර **වන පදය** ආධාර විභක්තියෙන් යෙදෙයි. **නිවෙස්හි** යන්න යෙදෙන්නේ ද ආධාර විභක්තියෙනි. දෙවන වාක්‍යයේ යෙදී ඇති **දරුවන් කෙරෙහි** යන්න ද ආධාර විභක්ති ගනී.

i. ශිෂ්‍යයෝ පන්ති **කාමරයෙහි** ඉගෙන ගනිති.
ii. තරුණයෝ **සැණකෙළි බිමෙහි** සැරිසරති.
iii. **රජු කෙරෙහි** තේජස පවතී.
iv. සිසුහු **පුටුවල** වාඩි වෙති.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මේ වාක්‍යවල **කාමරයෙහි, සැණකෙළි බිමෙහි, රජු කෙරෙහි, පුටුවල** යන පද ආධාර විභක්තියෙන් යෙදී ඇත.

**8.1 පහත වාක්‍යවල ආධාර විභක්ති පද යටින් ඉරි අඳින්න.**

i. ගුරුවරුන් කෙරෙහි ගෞරවය පතුරුවමු.
ii. වනයෙහි මල් පිපී ඇත.
iii. දෙමාපියෝ දරුවන් කෙරෙහි මෙත් පතුරුවති.
iv. ගස්වල සියොත්හු නද දෙති.
v. සිල්වතුන් කෙරෙහි සිත් පහදී.

## 9. ආලපන විභක්තිය

**දරුවනි,** පියවරුන්ට ගෞරව කරන්න.

මෙහි **දරුවනි** යන පදය ආමන්ත්‍රණය සඳහා යොදා ගනී. සමීපයෙහි සිට අමතන විට ඇමතුම් ලබන්නා යෙදෙන්නේ ආලපන විභක්තියෙනි.

i. **දුව,** මෙහි එන්න.
ii. **වනිතාවනි,** පෙරට එන්න.
iii. **නරඹන්නෙනි,** සවන් දෙන්න.
iv. **කුමරුනි,** මේ මල් දම පිළිගන්න.

මේ වාක්‍යවල දුව, වනිතාවනි, නරඹන්නනි, කුමරුනි යන පද ආලපන විභක්තියෙන් යෙදෙයි.

**9.1 පහත වාක්‍යවල ආලපන විභක්ති පදවලට යටින් ඉරි අඳින්න.**

i. නිදන්න පුත රන්කිරි.
ii. එන්න මඳ නලේ.
iii. දුවේ, මේ අහන්න.
iv. පුතුනේ, මේ බලන්න.
v. මිනිසුනි, යහ වැඩෙහි යෙදෙන්න.

**9.2 දී ඇති නාම පදවල ආලපන විභක්ති බහු වචන පද ලියන්න.**
වනිතාව, මන්ත්‍රීවරයා, ලේඛකයා, රියැදුරා, විචාරකයා

**නාමපදයක් (නාම ප්‍රකෘතියක්) ඒ ඒ විභක්තියෙහි ඒක වචන, බහු වචන ලෙස වර නැඟෙන ආකාරය විමසා බලමු.**

| විභක්තිය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා | කොවුලා | කොවුලෝ |
| කර්ම | කොවුලා | කොවුලන් |
| කර්තෘ | කොවුලා විසින් | කොවුලන් විසින් |
| කරණ | කොවුලා කරණ කොට ගෙන | කොවුලන් කරණ කොට ගෙන |
| සම්ප්‍රදාන | කොවුලාට | කොවුලන්ට |
| අවධි | කොවුලාගෙන් | කොවුලන්ගෙන් |
| සම්බන්ධ | කොවුලාගේ | කොවුලන්ගේ |
| ආධාර | කොවුලා කෙරෙහි | කොවුලන් කෙරෙහි |
| ආලපන | කොවුල (කොවුලෝ) | කොවුලනි |

1. **පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.**

| නාම පදය | විභක්තිය | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| මිනිසාට | උදා: සම්ප්‍රදාන | ✓ | - |
| බල්ලාගේ | | | |
| කුරුල්ලෝ | | | |
| මිත්‍රවරුනි | | | |
| ගසේ | | | |
| සිසුන් විසින් | | | |
| භික්ෂූන්ට | | | |
| මව කෙරෙහි | | | |
| ක්‍රීඩිකාවන්ගේ | | | |
| පියතුමනි | | | |

2. **පහත දැක්වෙන කතාවෙහි තද කළු අකුරින් දැක්වෙන පදවල විභක්ති දක්වන්න.**

**බලවතාට දුබලයා ද පිහිට වෙයි.**

එක් දිනෙක **සිංහයෙක්** ස්වකීය ගුහාව තුළ නිඳා සිටියේ ය. යම් කිසි **ශබ්දයෙකින්** බියට පත් **මීයෙක්** තැති ගෙන දුවන්නේ හදිසියෙන් **සිංහයාගේ** ඇඟට පැන්නේ ය. එයින් පිබිදුණු සිංහ තෙමේ ස්වකීය ශක්තිමත් **හස්තයෙන් මීයා** වසා ගත්තේ ය.

"අනේ! **දේවයන් වහන්ස,** ක්ෂමා කළ මැනවි, මෙය **මා** සිතා කළ වැඩෙක් නො වෙයි. එහෙයින් මා වැනි නිහීන දුබලයකු මැරීමෙන් ඔබ වහන්සේගේ රාජකීය හස්තය කිලිටි නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

නො කර ගන්නා සේක්වා'' යි මී තෙමේ යාච්ඤා කළේ ය. **සිංහයා** සිනා සී මීයා හැරියේ ය.

කාලයක් ගත විය. වනයෙහි ගොදුරු සොයා ගිය සිංහ රාජයා **දඩයම්කරුවකු විසින්** අටවන ලද උගුලෙක බැඳිණි. එයින් මිදෙන්නට ඔහු කළ හැම උත්සාහයෙකින් ම වූයේ බැඳුම් වඩ වඩාත් තද වීම ය. අහෝ! ස්වල්ප වේලාවකින් ඒ අනභිවනීය **මෘග රාජයාට** සෙලවීමට පවා නො හැකි විය. කළ හැකි වූයේ එක ම වැඩෙකි. එය හේ නො නවත්වා කෙළේ ය. සිටි පිය නො සොල්වා සිට වනය කම්පා වන සේ ගර්ජනා කෙළේ ය.

මොහොතක් ගත විය. පරණලා සෙලවෙන ශබ්දයක් ඇසිණ. පර ලොව සිහින බලමින් තැති ගෙන සිටි **සිංහ රාජයාගේ** ඇසට හමු වූයේ කිමෙක් ද? දිනෙක තමන්ට බැගෑ පත් ලෙස යාච්ඤා කොට **මරණයෙන්** ගැලැවී ගිය කුඩා මී පැටියා ය. උගෙන් කවර පිහිටක් පතන්නට ද?

මීයා කථා කෙළේ ය. ''දේවයන් වහන්ස, ආහෝ! **ඔබ වහන්සේට** මේ කිමෙක් වී ද? ඔබ වහන්සේ එක් දිනෙක මට අනුකම්පා කොට ජීවිත දානය කළ සේක. එහෙයින් භය නො වන සේක්වා! මම ඉතා දුබලයකු වුවත් ඔබ වහන්සේ මේ බන්ධනයෙන් මුදා හරින්නෙමි. දේවයන් වහන්සේට උපකාරයක් කිරීමෙන් කෙළෙහි ගුණ සැලැකීමේ මහඟු ගුණය පෙන්වන්නට අවස්ථාවක් ලැබීම ගැන මම ඉතා ප්‍රීති වෙමි.''

''අහෝ! **කුඩා මිත්‍රය**, කවරකුගෙන් වුව ද පිහිටක් ලැබෙතොත් ලැබිය යුත්තේ නම් දැන් ය. එහෙත් තොප වැනි ඉතා කුඩා දුබල **මිතුරකුගෙන්** දැන් මට ලැබිය යුතු පිහිට ලැබේ ය යි සිතීම දුෂ්කර ය'' යි සිංහයා කීයේ ය.

එසේ නො වේවා දේවයන් වහන්ස, තව මොහොතෙකින් ඉතා කුඩා දුබල මාගෙන් ඉතා බලවත් ඔබ වහන්සේට දැන් ලැබිය යුතු වන අසහාය පිහිට ලැබෙන සැටි බලනු මැනැවැ'' යි කියා මීයා වහා ම පැන ඒ ශක්තිමත් ලණු සිය තියුණු **දත්වලින්** කපන්නට වන්නේ ය.

ලණු සිඳී ගියේ ය. සිංහයා බන්ධනයෙන් මිදී ගියේ ය. ප්‍රීතියෙන් කුල්මත් වූ සිංහ රාජයා සිය කුඩා මිතුරා අතින් ඔසොවා සිප ගනිමින් කෘතඥතාව පෙන්වී ය.